astrologer.lk
Astrologer - Prabhath Karunanayaka

| | | |
|---|---|---|
| 2 3 | 1 | කු |
| කේ | කන්‍යා ලග්නය | රා |
| ච(ශ) 6 | ගු | ශුරබු 8 |

| | | |
|---|---|---|
| ච 2 | ශු | බුගු කේ |
| 4 | කුම්භ නවාංශකය | 10 |
| රා කු | ර | (ශ) 9 |

Date: xxxxx
Time: xxxxx pm
Time Zone: 5:30:00 (East of GMT)
Place: 79 E 50' 00", 6 N 55' 00"
Colombo, Sri Lanka
Lunar Yr-Mo: Shobhana - Jyeshtha
Tithi: Krishna Chaturthi (Me) (19.88% left)
Vedic Weekday: Tuesday (Ma)
Nakshatra: Sravanam (Mo) (85.35% left)
Yoga: Indra (Ra) (62.81% left)
Karana: Balava (Mo) (39.76% left)
Hora Lord: Jupiter (5 min sign: Dhanu)
Mahakala Hora: Jupiter (5 min sign: Kanya)
Kaala Lord: Saturn (Mahakala: Saturn)
Sunrise: 5:55:48 am
Sunset: 6:24:19 pm
Janma Ghatis: 16.9663
Ayanamsa: 23-19-52.10
Sidereal Time: 5:47:59
Vimsottari Dasa: Maha Dasas:
Moon: 1963-6-11 - 1971-12-25
Mars: 1971-12-25 - 1978-12-24
Rah: 1978-12-24 - 1996-12-24
Jup: 1996-12-24 - 2012-12-24
Sat: 2012-12-24 - 2031-12-25
Merc: 2031-12-25 - 2048-12-24
Ket: 2048-12-24 - 2055-12-25
Ven: 2055-12-25 - 2075-12-25
Sun: 2075-12-25 - 2081-12-25

| Body | Longitude | Nakshatra | Pada | Rasi | Navamsa |
|---|---|---|---|---|---|
| Lagna | 3 Kanya 33' 24.19" | UPha | 3 | Kanya | Kumbh |
| Sun - AmK | 26 Vrish 20' 20.27" | Mrig | 1 | Vrish | Simh |
| Moon - MK | 11 Makar 57' 12.79" | Srav | 1 | Makar | Mesh |
| Mars - PiK | 10 Simh 46' 18.76" | Magh | 4 | Simh | Kark |
| Mercury - GK | 3 Vrish 15' 00.29" | Krit | 2 | Vrish | Makar |
| Jupiter - BK | 20 Meen 55' 56.79" | Reva | 2 | Meen | Makar |
| Venus - PK | 4 Vrish 49' 37.35" | Krit | 3 | Vrish | Kumbh |
| Saturn (R) - AK | 29 Makar 43' 59.42" | Dhan | 2 | Makar | Kanya |
| Rahu - DK | 28 Mith 48' 57.12" | Puna | 3 | Mith | Mith |
| Ketu | 28 Dhanu 48' 57.12" | USha | 1 | Dhanu | Dhanu |

ඉදිරිපත් කිරීම -
ප්‍රවීණ ජ්‍යොතිෂවේදී ප්‍රභාත් කරුණානායක
www.astrologer.lk
33A st Lane , Rubber Watta Road, Gangodawila, Nugoda, Sri Lanka
Tel +94 771 649 203 Fax +94 112 802020
Email -info@astrologerlk.com

වර්තමානයේ පවතින ශුභ අශුභ

ඔබට දැනට විංශෝතතරී දශා ක්‍රමය අනුව යෙදෙන්නේ සෙනසුරු මහ දශාවයි.සෙනසුරු මහ දශාව වසර 2012.12.24 ඇරඹී වසර 2032.12.25 දිනයෙන් අවසන් වනු ඇත.එම සෙනසුරු මහ දශාව තුලම යෙදෙනු බුධට හිමි වු අන්තර් දශාව වසර 2015.12.28 ඇරඹී වසර 2018.9 .7 න් අවසන් වීමට නියමිතයි.

සෙනසුරු, ඔබ උපන් අවස්ථාව වන විට සවකේෂත්‍රව ලග්නයට ත්‍රිකෝණව යෙදෙන අතර ලග්නාධිපති බුධ අංශක 3 කලා 15 ක යෙදෙමින් උදාවු කන්‍යා ලග්නයේ ලග්නස්ඵුටය වන අංශක 3 කලා 33 දකින්නේ නමවැන්න මත යෙදෙමිනි.එසේම බුධ නමවැන්න අධිපති වු සිකුරු සමඟ සංයෝග වෙමින් ධර්මකර්මාධිපති යෝගයද උදාකර දී ඇත.මෙම තත්වයන් මගින් නිවේදනය වන්නේ ඔබට උසස් වු අධ්‍යාපනයක් හා උසස් සමාජ ඇසුරක් හිමි වන ජීවිතයක හිමි කම යෙදෙන බවයි.මේ අනුව ඔබට උදාව ඇති විංශෝත්තරී දශාව උසස් අධ්‍යාපනයට යහපත් බවක් ගෙන දෙනු ලබයි.

තවදුරටත් පැහැදිලි කරන්නේ නම් සෙනසුරු දශාව උදාව පැවතියද සෙනසුරු ඔබ උපන් අවස්ථාව වන විට යහපත් වු අයුරින් ජන්ම පත්‍රයේ යෙදීම මත තම දශාව තුලදී යහපත් බවක් උදාකර දිමට නියමිත බවකි.එසේම ලග්නාධිපති වු බුධද මෙම අන්තර් දා කාලයේදී ඔබට උසස් අධ්‍යාපනයක් මෙන්ම තම රැකියාවේද උසස් බවක් උදාකර දීමට සුදානමින් සිටි.එසේම උපන් අවස්ථාවේදි යෙදී ඇති සෙසු ග්‍රහ පිහිටීම් ආදිය නිවේදනය කරන්නේ ඔබට උසස් තතවයක් හිමි වන බවයි.ගුරුද සත්වැන්න මත යෙදෙමින් මෙම තත්වය තවදුරටත් සනාත කරනු ඇති.මෙම තත්වයන් අනුව විමසීමේදි ඉදිරිකාලය තුලදී ඔබගේ යහපත් වු වෘත්තියමය බලාපොරොත්තු ඉටු වන බව පැහැදිලි වේ.

නමුත් ඉහත අයුරින් යහපත් බවක් යෙදුනද තරමක අශුභ ග්‍රහගෝචරයන්ද යෙදී තිබිම මත තරමක බාධාවීම් යෙදිය හැකියි.මේ සඳහා සුදුසු වන වත්පිලිවෙත් පහත දක්වා තිබේ.දැනට මෙම වසරේ අගෝසතු 26 වන ගුරු දොලොස්වැන්න මත රාහු සමගින් යෙදීම තරමක අයහපත් බවක් උදාකර දිය හැකියි.මෙම තත්වය අනවශ්‍ය වියදම් මෙන්ම සිතේ තරමක අවිනිශ්චිත ස්භාවයක්ද ඇති කල හැකි අතර ලැබිම් ආදියටද තරමක බාධාවීම්ද උදාකර දිය හැකියි.නමුත් උපන් අවස්ථාව වන විට රාහු හා ගුරුගේ යහපත් පිහිටීම් මත තරමක සහන කාරී තත්වයන්ද යෙදිය හැකියි.කෙසේ හෝ පහත දැක්වෙන වත් පිලිවෙත් ආදියෙහි යෙදීම වඩාත්ම සුදුසු වනු ඇත.එසේම ඔබ මෙම


33A st Lane , Rubber Watta Road, Gangodawila, Nugoda, Sri Lanka
Tel +94 771 649 203 Fax +94 112 802020
Email -info@astrologerlk.com

වත් පිලිවෙත් ආදියෙහි දැඩි භක්තියෙන් තම අරමුණ අනිවාරයයෙන්ම ඉටු වේවා යනු ප්‍රාර්තනයෙන් යුක්තව යෙදීමත් , අපල දුරුවී තම බලාපොරොත්තු ඉටු වන බවත් තරයේම සිතට ගෙන කටයුතු කීරිම යහපති.

2017 ජනවාරි 27 පමණ වන විට ඔබ තරමක් ආරක්ෂා විය යුතු කාලවක් වනු ඇති.මෙම කාලයේ උදාවීමට නියමිත වන සෙනසුරු ජන්ම චීරාෂ්ඨක තත්වය ඉදිරියට 2025 අප්‍රෙල් 1 දක්වා තරමක අයහපත් බවක් ඇති කල හැකියි.ඉහක සඳහන් කල පරිදිම සෙනසුරුගේ යහපත් පිහිටිම මත මෙම අපලකාරී තත්වයද ඔබට එතරම් අයහපත් බවක් නොපෙන්වුවද ඔබගේ අවධානයට යොමු කිරිම සුදසුයි.මෙම කාලය සඳහාද වත් පිලිවෙත් පහත දැක්වේ.

ඔබ විසින් ඉදිරිපත් කර තිබු ගැටලුව සඳහා තවදුරටත් විස්තර දැන ගැනිමට අවශ්‍ය නම් විමසීමක් කල හැකි අතර එම තත්වයන් සඳහා යෙදෙන සම්මුඛ පරීක්ෂන හෝ වෙනත් පරීක්ෂන හෝ අවධානයට යොමු කල යුතු කාලයන් වේනම් එම කාලයන් පිලිබඳවද විශේෂයෙන් විමසිය හැකියි.

සමස්ත ජීවිතය.

ඔබ උපන් අවස්ථාව වන විට තරමක අසනීප හෝ පීඩාකාරී තත්වයන් ඔබට හා මවට ඇතිවිය හැකි වුවත් කෙමෙන් වැඩිමේදි තත්වය යහපත් විය හැකියි.ඔබට යම් යම් දුෂ්කරතා දරා ගනිමින් කටයුතු කීරිමට අවශ්‍ය මානසික ශක්තියක් ඇත්තෙකි.සමහර විට ප්‍රාථමික අධ්‍යාපනයට තරමක් බාධාවීම්ද යෙදිය හැකියි.දියුනුවීමට ආශාවක් කැමැත්ක් දක්වන්නෙකි.තරමක ආත්මාර්තකාමි බවක් යෙදෙතත් එයද දියුණුවට හේතුවක් වනු ඇති.ඒ තම අරමුණු ඉටුකරගත යුතුයැයි සිතා සෙසු කරුණු පසෙක ලා කටයුතු කරන බැවිනි.ධර්මය පිලිබඳව අවබෝධයක් යෙදේ.උසස් අධයාපනයක් යෙද්දෙ.දක්ෂතා යෙදේ.කටයුතු කාර්යසූර්යව කරන්නියකි. උසස් සමාජ ඇසුරක් යෙදෙනු ඇත.

තම දේපොල ආදිය නිසි ලෙස පවත්වාගෙන යාම සුදුසුයි.සමහර අවස්ථාවලදි යම් ගැටලු කාරිතත්වයන් යෙදිය හැකියි.කටයුතු ක්‍රමාණුකූලව පවත්වාගෙන යනු ඇති.දැනට ගතවන සෙනසුරු දශාවෙන් පසුව යෙදෙන බුධ මහ දශාව ජීවිතයට වඩාත් යහපත් බවක් ,සැපවත් බවක් එක්කර දිමට නියමිතයි.

හිස ,උදරය ,පපුව ආදි ප්‍රදේශන්හි පීඩාවන් යෙදිය හැකියි.

අපල සඳහා වත් පිලිවෙත්

ඉදිරිපත් කිරිම -
ප්‍රවීණ ජ්‍යොතිෂවේදී ප්‍රභාත් කරුණානායක
www.astrologer.lk
33A st Lane , Rubber Watta Road, Gangodawila, Nugoda, Sri Lanka
Tel +94 771 649 203 Fax +94 112 802020
Email -info@astrologerlk.com

මෙම වත් පිලිවෙත් නිසා භක්තියෙන් යුක්තව තමාට යහපතක් සිද්දවේවා යන ප්‍රාර්තනයෙන් යුතුව ඉටු කරන්න.ඹබට සිද්දකිරීමට අපහසු යමක් වේනම් අපවෙත දන්වා වෙනත් පිලිවෙලක් යොදා ගත හැකියි.

1 බෝධි පුජා පවත්වා විෂ්ණු - කතරගම - සුමන සමන් - ගම්භාර -ී පත්තිනි ආදි සියලුම දෙවියන්ට පින් අනුමෝදනාකර සියලුම දෙවින්ගේ දේව ආශීර්වාදයෙන් තම අපල දුරු වී සෙතක් ශාන්තියක් ලැබේවා යැයි ප්‍රාර්ථනා කිරීම යහපත්ය.

2 සෙනසුරාදා දිනවල උදේම ගිතෙල් මිශ්‍ර කරන ලද කිරිබත් ගුලි නමය බැගින් කපුටන්ට දන් දීම යහපති.

3 ගුණ යහපත් වැඩිහිටි අයට සුදුසු සංග්‍රහයක් කර ඔවුන්ගේ ආශීවාදය ලබා ගැනීම යහපත් ය.( වැඩිහිටි නිවාසයකට දානයක් දීම වුවත් යහපත් ය .)

4 නිල්මහනෙල් මල් හා රතු නෙලුම් බෝධියකට පුජා කරන්න.

5පත්තිනි මෑනියන් වෙතට වසර 2032 තෙක් බාරවී බාරය වශයෙන් වර්ෂයට අළුත් කරවා ගන්න.

6 නිවසේ බුදුන් වහන්සේට මල් - සුවඳ - පහන් පුජා කර විෂ්ණු කතරගම පත්තිනි ගම්බාර ආදි සියලුම දෙවියන්ට පිං අනුමෝදනා කර සියලුම දේවියන්ගේ ආශීර්වාදයෙන් සෙතක් ශාන්තියක් ලැබේවා යනුවෙන් ප්‍රාර්තනා කිරීම යහපත් ය.

7 නිවසේ කරණීය මෙත්ත සුත්‍රය ී,ජය පිරිත , අභිසම්භිදාන සුත්‍රය සද්ගායනා කීරීම යහපති.විශේෂයෙන් ජය පිරිත කියවීන්න.කාර්යබහුලතාව මතවේලාවෙන්කර ගැනිමට අපහසුවේ නම් හැකි අවස්තාවලදී නිසා ගෞරවයෙන් යුක්තව කියවීම සුදසුයි.

9 ඕම් ත්‍රෙයම්බකම් යජාමහේ - සුගාඩිම් පුෂ්ඨි වර්ධනං -

උරුවාරු කම්ම බන්ධනාත් - මෘත්‍යෝර් මුක්ෂීය මාමෘතාක්

අපගේ වෙබ් අඩවියෙන් මෙම ස්ත්‍රොත්‍රය ශ්‍රවණය කර නිසි උච්චාරණය දැන දවසේ ඕනෑම අවස්ථාවකදී නිසි ගෞරවය සහිතව ශිව දෙවියන් සිහිකර කියවීම සුදසුයි.

10 වෘත්තිය මය දියුණුව පිණිස සෙත් කවියක් විෂ්ණු දෙවියන් කතරගම දෙවියන් වෙනුවෙන් කියවිම සුදසුයි.

11ආබාධිත යාචක අයට තමාට හැකි අවස්ථා වලදී ආහාර හෝ සුදුසු යමකින් සංග්‍රහ කරන්න

ඉදිරිපත් කිරීම -
ප්‍රවීණ ජ්‍යොතිෂවේදී ප්‍රභාත් කරුණානායක
www.astrologer.lk
33A st Lane , Rubber Watta Road, Gangodawila, Nugoda, Sri Lanka
Tel +94 771 649 203 Fax +94 112 802020
Email -info@astrologerlk.com

12 කහ පැහැති ආහර ,කහපැහැති වස්ත්‍ර දන්දීමද ,කහපහැති මල් පුජාවද යහපති.සිවුරක් හෝ අට පිරිකරක් පුජා කර තම අපල දුරුවී දියුනුව හිමිවේවා යනුයෙන් ප්‍රාර්තනය යහපති.

"බුදු සරණින් සියලුම දෙවි පිහිටෙන් ඔබගේ සියලු අපල දුරුවී ඔබට සෙතක් ශාන්තියක් යහපතක් ම වේවා".යනුවෙන් අපිද ප්‍රාර්තනය කරමු


33A st Lane , Rubber Watta Road, Gangodawila, Nugoda, Sri Lanka
Tel +94 771 649 203 Fax +94 112 802020
Email -info@astrologerlk.com